# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்

**Department of Samurdhi Development**

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය

kfsph;> rpWth; mYty;fs; kw;Wk; r%f ghJfhg;G mikr;R - r%fghJfhg;G gphpT

**Ministry of Women, Child Affairs and Social Security – Social Security Division**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/DG/චක්‍රලේඛ | ඔබේ අංකය / உமது இல / Your No: ........ | දිනය / திகதி / Date: 2020.03.17 |

දිස්ත්‍රික් ලේකම්/අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ,
සමෘද්ධි කළමනාකරු (බැංකු සමිති / බැංකු),
සමෘද්ධි සංවර්ධන නිලධාරි,
ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සභාපතිවරු වෙත.

<u>අත්‍යාවශ්‍ය සේවා ඉටු කිරීමේදී ආරක්ෂණක විධිවිධාන යොදා ගැනීම</u>

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් “කොරෝනා වෛරසය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීම” මැයෙන් නිකුත් කල අංක HAF/01/02/HD/2019/(කා.ව.) හා 2020.03.15 දිනැති චක්‍රලේඛයට වැඩිමනක් වශයෙනි.

02. කොරෝනා වෛරසය (covid 19) පැතිරයාම වැළැක් වීමට මහජන ගැවසීම් හා ඒකරාශී වීම් අඩු කිරීමට තවදුරටත් රජයේ අවධානය යොමුකර තිබේ. ඒ අනුව රජයේ අත්‍යාවශ්‍ය නොවන සේවා සඳහා දින 03 ක නිවාඩු කාලයක් ද ප්‍රකාශයට පත් කර ඇත.

03. එවැනි තත්ත්වයක් යටතේ වුවද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ජීවන මට්ටම උසස් කිරීම වෙනුවෙන් එදිනෙදා පාරිභෝජනය වෙනුවෙන් ඉටුකල යුතු අත්‍යාවශ්‍ය රාජකාරි ඉටුකල යුතුව ඇත.

04. විශේෂයෙන්ම සමෘද්ධිලාභීන්ගේ සහනාධාර මුදල් ගෙවීමට අවශ්‍ය පියවර සමෘද්ධි බැංකු මගින් සිදුකල යුතුය. ඒ අනුව ජනතාව බැංකු වෙත ඒකරාශී වීම කළමනාකරණය කරමින් එම ගෙවීම් සිදු කරන ලෙස කාරුණිකව දන්වමි.

05. එහිදී බැංකු වල සේවකයින්ගේ හා ප්‍රතිලාභීන්ගේ ආරක්ෂාව තහවුරු වන ආකාරයට සුදුසු පරිදි අවශ්‍ය වැඩපිළියෙලක් සකස් කරන්නේ නම් මැනවි.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

1. දැත් පිරිසිදු කර ගැනීමට අවශ්‍ය විෂබීජ නාශක , ජලය ආදිය පහසුකම් සපයා දීම.
2. මුහුණු ආවරණ පැළදීම.
3. අත් වැසුම් පැළදීම
4. පුද්ගලයින් අතර පරතර තබාගෙන ප්‍රතිලාභීන් සමඟ ගනුදෙනු කිරීම.
5. වසම් වල ප්‍රජාමූල සංවිධාන මට්ටමින් ගෙවීම් කිරීම.

06. මෙවැනි අත්‍යාවශ්‍ය පිළියම් යෙදීම හා ප්‍රදේශයට ගැලපෙන ආරක්ෂක වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම ඔබ සැමගේ එකඟතාවය අනුව සිදු කරන්නේ නම් මැනවි.

07. බැංකු වෙත ජනතාව ඒකරාශී වීම සීමා කිරීම සඳහා ණය ගනුදෙනු හා ණය ඉල්ලුම්පත්‍ර ලබදීම වැනි කටයුතු කල් තැබීමටත් ණය ගෙවීම සඳහා දඩ මුදල් රහිතව 2020 අප්‍රේල් 30 දක්වා සහන කාලයක් ලබාදීමටත් අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

08. මේ දින 03 ක නිවාඩු කාලයක් ප්‍රකාශයට පත් කලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපදෙස් අනුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාල /ප්‍රාදේශීය ලේකම් කාර්යාල, බැංකු වල රාජකාරි සිදු කිරීමට උපදෙස් ලබාදී ඇත.

09. මේ වෙනුවෙන් වැයවන වියදමක් වේ නම් මීට පෙර ලබාදී ඇති චක්‍රලේඛ උපදෙස් අනුව වියදම් කරන ලෙසත් විශේෂ අවශ්‍යතාවයක් වේ නම් ඒ සම්බන්ධ අධ්‍යක්ෂ ක්ෂුද්‍රමූල්‍යට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා ලෙසත් දන්වමි.

10. මිනිසුන්ගේ දෛනික ජන ජීවිතය අඩාල නොවන පරිදි සියලු කටයුතු පවත්වා ගෙන යෑමට රජය හැකි උපරිම උත්සාහයක නිරතවෙයි. උත්ගතව ඇති තත්ත්වය නිවැරදිව තේරුම් ගෙන කොරෝනා වෛරසය ව්‍යාප්තිය පාලනය සඳහා සෑම ග්‍රාම නිලධාරි වසමක්ම නියෝජනය වන පරිදි ඔබ සැමගේ සහාය ලබාදීම අත්‍යාවශ්‍ය බවද කාරුණිකව දන්වමි.

මේ පිළිබඳව ඔබ සැම දක්වන සහය අගය කරමි.

ආර්.පී.කේ. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :-

| | | | |
|---|---|---|---|
| 1. | කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය ගරු පවිත්‍රා දේවි වන්නිආරච්චි මැතිතුමිය | - | කා.දැ.පි. |
| 2. | ලේකම්, කන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය | - | කා.දැ. පි. |
| 3. | රාජ්‍ය ලේකම්, සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය | - | කා.දැ. පි. |
| 4. | විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව | - | අ.ක.ස. |
| 5. | ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - | අ.ක.ස. |
| 6. | ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - | අ.ක.ස. |
| 7. | සියලුම අංශ ප්‍රධානීන් | - | අ.ක.ස. |